# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1426/21 – 2006 ජනවාරි 06 වැනි සිකුරාදා – 2006.01.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

මධ්‍යම පළාත් සභාව

නගරාධිපති, සභාපති සහ සභික දීමනා ගෙවීම පිළිබඳ නියෝග හා රීති සංශෝධනය

2005.05.06 දින අංක 1391/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළකරන ලද දීමනා පිළිබඳ නියෝග හා රීති පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

(1) මහ නගර සභා නියෝග අංක 01 යටතේ ඇති මහ නගර සභාවේ සභාපතිවරුන්ට යන්න මහ නගර සභාවේ නගරාධිපතිවරුන්ට යනුවෙන් නිවැරදි කරමි.

(2) ප්‍රාදේශීය සභා රීති අංක 3(1) යටතේ ඇති මහ නගර සභා සභාපතිවරයෙකු යන්න ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු යනුවෙන් නිවැරදි කරමි.

සරත් ඒකනායක,<br>
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන<br>
විෂයභාර අමාත්‍ය,<br>
මධ්‍යම පළාත.

2005 දෙසැම්බර් මස 28 වැනි දින,<br>
මහනුවර දී.

01-518/1

---

මධ්‍යම පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) (i), (ii), (iii) වගන්ති සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 (1) (i), (ii), (iii) වගන්තිය යටතේ කරනු ලබන නියමය

2004.10.21 දින අංක 1363/21 දරන සහ 2004.10.26 දින අංක 1364/8 දරන ගැසට් පත්‍ර මගින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව අත්හිටුවන විට සහ සභිකයින්ගේ ධුරය දැරීම අත්හිටුවන විට, මංගල පුෂ්පකුමාර ප්‍රනාන්දු මහතා සභික ධුරයෙන් ඉල්ලා අස්වී සිටි බැවින් සහ ලියනගෙදර

රංජිත් ලියනගේ මහතා සභිකයෙකු ලෙස කටයුතු කිරීම ආරම්භකර නොතිබූ බැවින් එම දෙදෙනා ධූරයෙන් ඉවත් කරන සභිකයන් ලෙස නිවේදනය නොකරන බවත් ඒ අනුව 2005.09.02 දින අංක 1408/27 ගැසට් නිවේදනයෙන් ඔවුන්ගේ නම් ඉවත්කර එම ගැසට් නිවේදනය සංශෝධනය කරන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන
විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2005 දෙසැම්බර් මස 28 වැනි දින,
මහනුවර දී.

01-518/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී